# සත්ව චර්යා අනුකරණය කරමු.

නාට්‍යක් නිර්මාණය කිරීමේදී මිනිස් චරිත පමණක් නොව ඔබට සත්ව චරිතද නිරූපණය කළ හැකි විය යුතුය. එහිදී අප සතුන්ගේ විවිධ චර්යා රටා පිළිබඳ නිරීක්ෂණය කළ යුතුය. එවැනි සත්ව චරිත මගින් මානුෂීය ගුණාංග ඉදිරිපත් කළ හැක.

- නරිබෑනා
- පුංචි අපට දැං තේරෙයි
- සිංහබාහු
- මීපුර වැසියෝ



එවැනි නාට්‍ය නිර්මාණ වේ. මෙවැනි නාට්‍ය නිර්මාණ නැරඹීම සත්ව චරිත නිරූපණය කිරීමේදී ඔබට මහත් වැදගත් වේ.

සත්වයාගෙන් සත්වයාට ඔවුනට ආවේණික රිද්මයක්, හඬක්, චලනයක් හා ඉරියව් පවතී. ඒවා එකිනෙකාට වෙනස් වේ. අප එවැනි ක්‍රියා හොඳින් අධ්‍යනය කිරීම මගින් ඕනෑම සත්ව චරිතයක් අනුකරණය කිරීමේ හැකියාව පවතී.

සත්ව ලෝකයේ ඇති විශ්මිත හැසිරීම් හොඳින් නිරීක්ෂණය කිරීමෙන් ඔබට සාර්ථකව සත්ව චරිත නිරූපණය කළ හැක.



පැවරුම :

01) අහස කඩා වැටීම ජන කතාව කියවන්න.

02) ඉහත කතාවේ ඔබ සිත්ගත් අවස්ථා 2ක් ඇද දක්වන්න.